දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2018 පරීක්ෂණය (2015 පුනර්) - 2018 සැප්තැම්බර්/ඔක්තෝබර්
First Examination in Arts (External) 2018 (Repeat 2015) – September/October 2018

# සවිප්‍ර 1.1 - සමාජ විද්‍යාවේ හා මානව විද්‍යාවේ මූලධර්ම
# SGY 1.1 - Principles of Sociology and Anthropology

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

---

01. (i) විද්‍යාවක් යනුවෙන් හඳුන්වන්නේ කුමක්දැයි දක්වා සමාජවිද්‍යාව විද්‍යාවක් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 04)

(ii) ශුද්ධ විද්‍යා හා සමාජීය විද්‍යා අතර වෙනස පැහැදිලි කරන්න.
(ලකුණු 06)

(iii) සමාජවිද්‍යාව යනු කුමක්දැයි නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 10)

02. (i) ප්‍රොතෙස්තන්ත ආචාරධර්ම හඳුන්වාදීම සමාජ වෙනසකට දායක වූයේ කෙසේදැයි පෙන්වා දෙන්න.
(ලකුණු 04)

(ii) මානව විද්‍යාව සහ සමාජවිද්‍යාව අතර පවතින සම්බන්ධතාවය කරුණු 03 ක් ආශ්‍රයෙන් සංසන්දනය කරන්න.
(ලකුණු 06)

(iii) කාර්මික විප්ලවය සහ ප්‍රංශ විප්ලවය විසින් සමාජවිද්‍යාවේ බිහිවීමට සිදුකරන ලද බලපෑම පැහැදිලි කරන්න.
(ලකුණු 10)

03. (i) සංස්කෘතිය පිළිබඳ පාරිසරික නියතිවාදය යනු කුමක් ද?
(ලකුණු 04)

(ii) සංස්කෘතික විසරණය සහ සංස්කෘතික ලැග්ම යනු කුමක්දැයි නිදර්ශන සහිතව පෙන්වා දෙන්න.
(ලකුණු 06)

(iii) සංස්කෘතිය, සවියත්වය සහ සමාජ පැවැත්ම අතර පවතින සම්බන්ධතාව යෝග්‍ය නිදර්ශන ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

04. (i) සමාජ පැවැත්ම සම්බන්ධයෙන් නිෂ්පාදන ක්‍රියාවලිය අත්‍යවශ්‍ය වන්නේ යැයි ඇතැම් සමාජ විද්‍යාඥයින් තර්ක කරන්නේ ඇයි දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ii) "විවාහය සමාජ ව්‍යුහය නැවත සකස් කරන මාධ්‍යයක්" යැයි රැඩ්ක්ලිෆ් බ්‍රවුන් තර්ක කරන්නේ කවර පදනමකින්දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

05. (i) පර්සිවල් මර්ඩොක් විසින් පෙන්වා දෙන ලද පවුල් සංස්ථාවේ සම්ප්‍රදායික කෘත්‍යයන් වර්තමානය වන විට අන්තර්ජාලයේ ව්‍යාප්තිය සහ සමාජ මාධ්‍යයන් ප්‍රචලිතවීම හේතුවෙන් සැලකිය යුතු මට්ටමකින් වෙනස් වී ඇත්තේ කවර ආකාරයෙන්දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ii) දේශපාලනය සහ ඥාතිත්වය අතර පවතින සම්බන්ධතාවය සමාජවිද්‍යාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

06. (i) නිලබල ක්‍රමය බිහිවීමට බලපෑ සාධක පිළිබඳව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ii) නිලබල ක්‍රමයේ මූලික ලක්ෂණ පෙන්වා දෙන්න.

(ලකුණු 06)

(iii) නිලබල ක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේ දී මතුවී තිබෙන ගැටළු පෙන්වා දෙන්න.

(ලකුණු 08)

07. (i) සමාජ වෙනස්වීම පිළිබඳ ඔගස්ට් කොම්ට් ගේ සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) බටහිරකරණය යනු කුමක් ද?

(ලකුණු 08)

(iii) සරල සමාජයක් නවීකරණ ක්‍රියාවලියට නතු වීමේ දී සිදුවන වෙනස්කම් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

08. (i) ඔබ ආගම සමාජ ආයතනයක් ලෙස හදුනා ගන්නේ කෙසේ ද? ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 10)

(ii) ආගම සමාජ ආයතනයක් ලෙස සැලකීමේ දී එහි කෘත්‍යයන් මොනවා ද?

(ලකුණු 10)

***********************************************